ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව - 2010

---

## 1 මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභාව 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2010 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභාවේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඉදිරිපත් කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

#### 1.2.1 නොසැසඳූ පාලන ගිණුම්

2009 වර්ෂයේ සිට පැවත එන රු.56,064 ක හඳුනා නොගත් ශේෂය සමාලෝචිත වර්ෂයේදීද හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

#### 1.2.2 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

විගණනයේදී නිරීක්ෂණය වූ නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ යනාදියට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 2007 පෙබරවාරි 26 දිනැති අංක 424 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛය | එක් දුරකථන පද්ධතියක් මගින් සියළුම අංශයන්හි දුරකථන සම්බන්ධ කොට නිලධාරීන් වෙත සෘජු හා අභ්‍යන්තර දුරකථන පහසුකම් සපයා දී නොතිබුණු අතර, එක් එක් දුරකථන සඳහා වෙන් වෙන්ව බදු කුලී ගෙවා තිබුණි. |

| | | |
|---|---|---|
| (ආ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය 2.8.4 තාක්ෂණික ඇගයීම් කමිටුවේ එක් සාමාජිකයෙක් අවම වශයෙන් ප්‍රසම්පාදන අස්ථිත්වයෙන් බාහිර ප්‍රසම්පාදන විෂයය සම්බන්ධයෙන් දැනුවත් විය යුතුය. | මෝටර් රථ දෙකක් මිලදී ගැනීමේදී හා එනර්ජ් මීටර් මිලදී ගැනීම සඳහා පත්කල තාක්ෂණික ඇගයීම් කමිටුවට කොමිෂන් සභාවේ නිලධාරින් පමණක් සමන්විත වී තිබුණි. |

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය සමාලෝචනය

#### 2.1.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය තුළ කොමිෂන් සභාවේ අරමුදල් මෙහෙයුම්වලින් රු.20,708,819 ක වියදම ඉක්ම වූ ආදායමේ අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපව ඉකුත් වර්ෂය සඳහා වියදම් ඉක්මවූ ආදායමේ අතිරික්තය රු.37,741,980 ක් විය. ඉකුත් වර්ෂය හා සැසඳීමේදී මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.14,033,162 ක අඩුවීම සඳහා ආදායම් අඩුවීම සහ පුද්ගල පඩිනඩි, ගමන් වියදම්, ගිවිසුම්ගත සේවා ඇතුළු වෙනත් වියදම් වැඩිවීම බලපා තිබුණි.

### 2.2 කාර්ය සාධනය

ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභාවේ 2010 වර්ෂයේ කාර්ය සාධනය සම්බන්ධයෙන් කරන ලද නියැදි පරීක්ෂාවේදී පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2002 අංක 35 දරන ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභා පනතේ 14(2)(1) වගන්තිය යටතේ වූ විදුලිය, ජලය හා ඛනිජ තෙල් කර්මාන්ත සම්බන්ධයෙන් නියාමන ලෙස කටයුතු කිරීම සඳහා 2004 වර්ෂයේ සිට මේ දක්වා පුනරාවර්තන වියදම් රු.177,673,294 හා ප්‍රාග්ධන වියදම් රු.29,283,689 ක් වැය කර තිබුණත්, 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනත අනුව විදුලි කර්මාන්තයේ නියාමන කටයුතු 2009 අප්‍රේල් 08 දින සිට ඉටු කරනු ලබන නමුත්, ජලය හා ඛනිජ තෙල් කර්මාන්තවලට (ලිහිසි තෙල් කර්මාන්තය හැර) අදාල පනත් සංශෝධන අනුමත නොවීම නිසා එම කර්මාන්තවල නියාමන කටයුතු ඉටු කිරීමට නොහැකි වී තිබුණි.

(ආ) 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ 9 වගන්තිය ප්‍රකාරව මෙ.වො. 25 ට වැඩි ධාරිතාවකින් විදුලිය උත්පාදනය කරන 2007 අංක 7 දරන සමාගම් පනත අනුව පිහිටුවා ඇති රජයේ කොටස් ප්‍රාග්ධනය 50% ක් නැති සමාගම්වලට විදුලිය උත්පාදනය කිරීම සඳහා බලපත්‍ර නිකුත් කළ නොහැක. දැනටමත් ධාරිතාවය මො.වො. 25 ඉක්මවා විදුලිය උත්පාදනය කරන, සමාගම් පනත යටතේ ලියාපදිංචි රජයේ කොටස් ප්‍රාග්ධනය 50% ක් නොමැති සමාගම් 06 කට බලපත්‍ර නිකුත් කර නැතත්, එම සමාගම් විසින් උත්පාදනය කරනු ලබන විදුලිය ශ්‍රී ලංකාවේ විදුලි බල ධාරිතාවයට එක් කර ගෙන තිබිණි. මේ සම්බන්ධයෙන් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ 2011 මැයි 19 දිනැති ලිපියෙන් 2009 අංක 20 දරණ විදුලිබල පනතේ වගන්ති 9(1) ප්‍රකාරව අවශ්‍යතා සපුරා නොමැති බැවින් එම ආයතනයට බලපත්‍ර නිකුත් කිරීමට හැකියාවක් නොමැති බැවින්, ඊට අදාල කටයුතු සම්පාදනය කර දෙන මෙන් විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය වෙත අවධානය යොමු කොට ලිපියක් යවා ඇති බවත් විගණනයට දැනුම් දී තිබුණි.

(ඇ) 2010 වර්ෂය තුළ ලිහිසි තෙල් වෙළඳපල කටයුතු තුළ සමාගම් 13 ක් ලයාපදිංචි වී තිබුණු අතර, ඉන්වොයිස් වටිනාකමෙන් 0.5% ක විචලා‍ය ලියාපදිංචි ගාස්තුවලින් රු.මිලියනය ඉක්මවා ගනුදෙනු කර තිබුණේ සමාගම් 05 ක් පමණි. ඒ අනුව 2010 වර්ෂයේ සමාගම් 05 කින් විචල්‍ය ලියාපදිංචි කිරීමේ ගාස්තු ලෙස රු.18,114,029 ක් කොමිෂන් සභාව වෙත 2011 මාර්තු 31 දින වනවිට ලැබී තිබුණි.

## 2.3 කළමනාකරණ අකාර්යක්ෂමතා

(අ) 2009 දෙසැම්බර් 31 දිනට පොත්වලින් ඉවත් කරන ලද රු.1,324,436 ක පිරිවැය වූ වත්කම්ද, 2010 දෙසැම්බර් 31 දින පොත්වලින් ඉවත් කරන ලද ලී බඩු හා සවි කිරීම් යටතේ ඇති රු.83,344 ක් වටිනා වත්කම්ද නිසි පරිදි බැහැර කර නොතිබුණි.

(ආ) ලංකා බැංකුවේ දේපළ සංවර්ධන හා කළමනාකරණ පුද්ගලික සමාගමට අයත් ගොඩනැගිල්ලේ 6 වන මහලේ මහජන උපයෝගිතා කොමිෂන් සභාව පවත්වාගෙන යාම සඳහා 2006 මාර්තු 26 දින සිට ගිවිසුම්වලට එළඹී තිබුණි. මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

කොමිෂන් සභා කාර්යාලය පවත්වාගෙන යාම සඳහා 2006 මාර්තු සිට 2009 සැප්තැම්බර් දක්වා වර්ග අඩි 2296.03 ක්ද, 2009 සැප්තැම්බර් සිට නොවැම්බර් දක්වා මුළු වර්ග අඩි ප්‍රමාණය 3822.23 ක්ද, ගිවිසුම්ගත බැඳීමකට පත්වී කුලියට ගෙන තිබියදී, 2009 දෙසැම්බර් සිට 2010 සැප්තැම්බර් දක්වා අතිරේක බිම් වර්ග අඩි 153 ක් ගිවිසුම්ගත බැඳීමකට පත් නොවී මාස 10 ක් සඳහා රු.151,161 ක කුලියක් ගෙවීම් කර තිබුණි. තවද, 2010 සැප්තැම්බර් සිට 2012 මාර්තු දක්වා තවත්

අතිරේක වර්ග අඩි 2407.88 ක බිම් ප්‍රමාණයක් කුලියට ගෙන 2010 සැප්තැම්බර් සිට 2011 ජනවාරි දක්වා ඒ වෙනුවෙන් රු.3,132,330 ක් ගෙවීම් කළද, එම අතිරේක බිම් ප්‍රමාණය 2011 පෙබරවාරි 08 වන විටත් ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.

## 2.4 විගණන හා කළමනාකරණ කමිටු

-----------------------------------

රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ 2003 ජුනි මස 02 දිනැති පීඊඩී 12 චක්‍රලේඛයට අනුව විගණන හා කළමනාකරණ කමිටු පත් කර නොතිබුණි.

## 2.5 අයවැය පාලනය

------------------

අයවැය පාලනය සම්බන්ධයෙන් කළ නියැදි පරීක්ෂාවේදී පහත කරුණු නිරීක්ෂණය විය.

(i) වියදම් වර්ග 09 ක් වෙනුවෙන් සලසා තිබුණු ප්‍රතිපාදනය ඉක්මවා රු.2,591,834 ක් වැය කර තිබුණි.

(ii) අයවැය ලේඛනය මගින් ප්‍රතිපාදන සලසා නොතිබුණු වියදම් වර්ග 05 ක් සඳහා රු.1,747,526 ක් වැයකර තිබුණි.

## 3. පද්ධති හා පාලන

------------------

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු පිළිබඳව වරින් වර කොමිෂන් සභාවේ සභාපතිවරයා දැනුවත් කරන ලදී. ඒ අනුව, පහත දැක්වෙන පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුය.

(අ) ගිණුම්කරණය
(ආ) අත්තිකාරම්
(ඇ) ප්‍රසම්පාදන ලිපිගොනු පවත්වා ගැනීම